## 160 - දුවන ලෙසට පවසෙ පෙළි පෙළි

දුවන ලෙසට පවසෙ පෙළි පෙළි
මුව දෙන උල් දියට සුසුම් ලා
හැපෙයි මගේ දෙවියනේ
මගෙ අත් බව ඔබමැ සොය සොයා //

වතට වත දිදි දකිම් ඔබ මම කෙදා
දෙවිඳු මගේ සුරිඳු මගේ එකමැ හිමි සඳා

මගෙ පණ වන ඔබට දෙවියනේ
මන දොල මගෙ සයින් තැවෙන්නේ
ලැබෙනු ඇති දැ මට කෙදා
දැකැ ගන්නට මුහුණ දෙව් සදා //

උදේ හවහේ මගේ අහර නේ - ගලන කඳුළු මගේ ඇස් දෙකේ
දෙවියෝ කොහෙදැ දැන් තගේ
ඇනුම් බැණුම් ඇසේ ඇමැ දිනේ //

කොහොම ගියෙමි සෙනඟ සමගෙ'දා බලා මැදුර දෙවිඳු වඳිනටා
සිහිවන වත එහෙව් දා
හද මගෙ යෙයි දැනුත් උතුරලා //

පසස ගැයුම් තුති ගී මැද්දේ - ජය මංගල උදන් නෙ සිරියේ
එදා ගෙවුණෙ කොහොමැදෝ
සිහි වන විට තවමැ හද තැවේ //

ඇයිදැ තවමැ ආත්මයෙණි මේ - දුකට පත්වැ ඉන්නේ වැලැපී
නොසන්හිඳි තැවෙන්නේ - පතා හිඳුව දෙවියන් සරණේ //